# හඳගල කන්ද ගල් ලෙන් රජ මහා විහාරය

# පටුන


| | | |
|---|---|---|
| 1. | පෙරවදන | |
| 2. | 2600 සම්බුද්ධත්ව ජයන්තිය සඳහා පුරාවිද්‍යාත්මක උපදෙස් මත ප්‍රතිසංස්කරණය වන හඳගල කන්ද පුරාණ ගල්ලෙන් රජ මහා විහාරය<br>- පී. වීරසේකර | 1 - 6 |
| 3. | හඳගල විහාරයේ ලෙන් සෙල්ලිපි<br>- සී. ඩබ්ලිව්. නිකොලස් | 7 - 12 |
| 4. | හඳගල විහාරය<br>- මහාචාර්ය විමල් විජේරත්න | 13 - 23 |
| 5. | සෙල්ලිපි - අර්ථ සහිතව | 25 - 29 |
| 6. | සෙල්ලිපි වල ඡායාරූප පිටපත් | 30 - 37 |
| 7. | 2600 සම්බුද්ධ ජයන්තිය නිමිත්තෙන් ඇරඹි ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ව්‍යාපෘතිය | 39 - 44 |
| 8. | Handagala - Kanda ancient cave tample | 45 - 50 |
| 9. | Texts of the cave inscriptions at Handagala vihara | 51 - 56 |
| 10. | Handagala Viharaya | 57 - 66 |
| 11. | Restoration and Development Project | 67 - 72 |

# පෙරවදන

බුදුරජාණන් වහන්සේ ක්‍රි. පූ. 543 දී පිරිනිවන් පාන ලද දින, එනම් වෙසක් පුන් පසළොස්වක් පොහොය දින විජය කුමරු හත්සියයක් පිරිස සමග දඹදිව සිට ශ්‍රී ලංකාවට සේන්දු වූයේ යයි අප රටේ වංශ කථාව වන මහාවංශයේ සඳහන්ව ඇත. අප රටේ ලිඛිත ඉතිහාසය ඇරඹ තිබෙනුයේ එම සිදුවීමත් සමග ය.

විජය කුමරුගේ පැමිණීමට බොහෝ පෙර සිටම පාෂාණ වලින් සකසාගත් මෙවළම් භාවිතා කරමින් සිටි ජන කණ්ඩායම් මෙරට වාස භූමි කරගෙන සිටි බවට විවිධ පළාත්වල සිදුකරණ ලද පුරාවිද්‍යාත්මක කැණීම් වලින් සාක්ෂි මතුවී ඇත. ආදි පාෂාණ හෙවත් 'මෙසොලිතික' යුගයක සළකුණු වන ගල් පතුරු වැනි මෙවළම් කැබලි මෙන්ම ඊට පසුව ඇතිවූ නව පාෂාණ හෙවත් 'නියොලිතික' යුගයට අයත් ඇතැම් භාණ්ඩ කැබලි ද තවත් පුරාවිද්‍යාත්මක කැණීම් වලින් මතුවී ඇත. ස්ථිර වාසස්ථාන, කෘෂිකාර්මික දිවි පෙවෙත, සත්ව පාලනය, මැටි බඳුන් සහ වඩා දියුණු මෙවලම් භාවිතය ලොව පුරාම එම යුගය සංකේතවත් කළ ලක්ෂණ විය. මෙරට කැණීම්වලින් ලැබී ඇති ඉහත සඳහන් සාක්ෂි, ක්‍රි. පූ. 3010 තරම් අතීතයට සම්බන්ධ වෙතැයි පුරාවිද්‍යාඥයන්ගේ නිගමනය වේ. ඈත අතීත අවධියේ දී ගල් ගුහාදිය ආශ්‍රිතව වාසය කරමින් වැඩි වශයෙන් දඩයමෙන් යැපුණු මෙම ජන කණ්ඩායම් පසු කාලයේදී ගොවිතැන් කටයුතු ජීවනෝපාය මාර්ගය කරගෙන ඇත. පුරාවිද්‍යාත්මක කැණීම්වලින් මතුව ඇති සාක්ෂි අනුව ක්‍රි. පූ. 300 වර්ෂය පමණ වන විට මෙම ජන කණ්ඩායම් තරමක් දියුණු වූ ජන සමාජයක් ලෙසට දියුණුවී අනුරාධපුරයේ සහ යාබද පෙදෙස්වල වාසය කළේ යැයි සිතිය හැක.

ක්‍රිස්තු වර්ෂ ක්‍රමය උදාවීමට සියවස් පහකට පමණ පෙර ඉන්දු-ආර්ය භාෂාවක් භාවිතා කළ ජන කණ්ඩායම්වල ස්ථිර ජනාවාස මෙරට ඉදිවෙමින් පැවති අවදියේදී උතුරු ඉන්දියාවේ බුදුදහම උදාවී

මගධ දේශය වැනි පෙදෙස්වල පැතිරෙමින් පැවතිණි. මගධ දේශයේ මයුර රජ පෙළපතේ චන්ද්‍රගුප්ත අධිරාජයාගේ පාලන සමයේදී (ක්‍රි. පූ. 321-297) එම රාජ්‍යය ප්‍රබල තත්ත්වයකට පත්වූ අතර ඔහුගේ මුනුබුරු වූ අශෝක (ක්‍රි. පූ. 268-231) රාජ්‍යත්වයට පත්වීමෙන් පසු මයුර රාජ්‍යයේ බලය තව තවත් වර්ධනය වී ඇත. බුද්ධ ශාසනය ප්‍රචලිත කිරීම සඳහා අශෝක අධිරාජයා බලවත් උනන්දුවක් දක්වා ඇති බව ඓතිහාසික කරුණුවලින් අනාවරණය වේ. බුදුදහම යාබද රටවල ප්‍රචාරය කිරීම සඳහා අශෝක අධිරාජයා විසින් දූත පිරිස පිටත් කර යැවූ අතර මහින්ද යන නමින් මහණවී සිටි එතුමාගේ පුත් රුවනගේ නායකත්වයෙන් දූත පිරිසක් මෙරටට පිටත්කර එවන ලදී. පොසොන් පොහොය දිනෙක මිහින්තලා පව්වට එම දූත පිරිස පැමිණීම, මෙරට අනාගතය මුළුමනින්ම වෙනස් කිරීමට තුඩු දුන් ඓතිහාසික සිදුවීම වූ බව අවිවාදයෙන් පිළිගනු ලබන සත්‍යයකි. එවකට ලක් රජව සිටි දෙවනපෑතිස් මහරජු (ක්‍රි. පූ. 247-207) මිහිඳු හිමියන්ට සවන් දී බුදු දහම වැළඳ ගැනීමෙන් අනතුරුව රටවැසියෝද ඒ සමගම බුදුන්වහන්සේගේ ධර්මය පිළිගත්හ. දෙවනපෑතිස් රජුගේ නායකත්වය සහ අනුග්‍රහය ලැබීම නිසා විශේෂයෙන්ම අනුරාධපුරයෙහි හා රාජධානියේ සෙසු පෙදෙස්වල වෙහෙර විහාරාදිය ඉදි වන්නට පටන් ගැනුණි. ථූපාරාමය ඉන් පළමුවැන්න විය. බුදුරදුන් බුදුවූ අවස්ථාවේදී පිටදී සිටි බෝ ගසෙහි ශාඛාවක් මිහිඳු හිමියන්ගේ නැගණිය වූ සංඝමිත්තා තෙරණිය විසින් දඹදිව සිට වැඩමවන ලදුව අනුරාධපුර මහමෙව්නා උයනේ රෝපණය කරණ ලදී. ඊට අමතරව එතුමිය විසින් අප රටෙහි මෙහෙණි සසුනක්ද ඇති කරණ ලදී. අවුරුදු දහස් ගණනක් අද වනතුරු අවිච්ඡින්නව අප රට පවතින බෞද්ධ සිංහල ශිෂ්ටාචාරයේ ආරම්භය ඇති වූයේ එලෙස ය.

සිංහල ජාතිය සම්බන්ධව මෙතෙක් නොවෙනස්ව ආරක්ෂිතව පවතින පුරාවිද්‍යාත්මක නටබුන් වනුයේ හඳගල කන්දෙහි මෙන් දිවයින පුරා දක්නට ඇති සෙල් ලිපි කොටන ලද ලෙන් බව අපගේ කීර්තිමත් පුරාවිද්‍යාඥයකු වූ මහාචාර්ය සෙනෙරත් පරණවිතාන මහතා ප්‍රකාශ කර ඇත. කඳුබිම්වල ස්වභාවික ලෙස කළුගලින් සෑදී ඇති මෙම ගුහා, හඳගලට අමතරව මිහින්තලේ, රිටිගල, දඹුල්ල, සිතුල්පව්ව වැනි සුප්‍රසිද්ධ පුදබිම් වල දක්නට ඇත. හඳගල කන්දෙහි එවැනි ලෙන් හතළිස් පහක් පමණ හඳුනාගෙන ඇති අතර, වඩාම ලෙන්

සංඛ්‍යාවක් දක්නට ඇති ස්ථාන අතරින් එකක් ලෙස හඳගල කන්ද සැළකිය හැක.

කවර ස්ථානයක වුව ලෙනකට අලුතින් එකතු කර ඇති එකම අංශය වනුයේ ලෙන තුළට වැසි ජලය හඹා ඒම වැළැක්වීම සඳහා කටාරම් කොටා තිබීමය. සමහර ලෙන් තුළ ඉඩකඩ ඇති බිත්තිවල හෝ ලෙන් පියස්සෙහි ඇතුල් පැත්තෙහි බදාමයක් ආලේප කර සිතුවම් ඇඳ තිබේ. හඳගල ද විශාලම ලෙනෙහි පියස්සෙහි ඇඳ තිබි ලොකු සිතුවමක කොටසක් ඉතුරුවී ඇත. මෙම ලෙන්වලින් බොහොමයක කටාරමට පහතින් ගල් මුහුණතෙහි අක්ෂර කොටා ඇත. ඉන් කෙටිම ලිපියෙහි ඇත්තේ බ්‍රාහ්මී අක්ෂර හතරක් පමණක් වන බවත් දිගම ලිපියෙහි අක්ෂර හැත්ත පහකට වැඩි සංඛ්‍යාවක් ඇති බවත් ලෙන් සෙල් ලිපි 1200 කටත් වැඩි සංඛ්‍යාවක් පිටපත් කර ඇති බවත් පරණවිතාන මහතා සඳහන් කර ඇත.

මෙම සෙල් ලිපිවල අක්ෂර, හැඩහුරුකමින් ඉන්දියාවේ වඩාත්ම පැරණි සෙල් ලිපිවල අක්ෂරවලට මෙන්ම අශෝක අධිරාජයාගේ සෙල් ලිපි කොටා ඇති අක්ෂරවලට සම වන බවත් පරණවිතාන මහතා තවද සඳහන් කර ඇත.

බොහෝවිට වන රොදින් වැසී, කඳුවල ගල්ලෙන් පිහිටි ස්ථානවලට ළඟාවීම දුෂ්කර වූ අතර භාවනානුයෝගී භික්ෂූන්ට අවශ්‍ය අන්දමේ සන්සුන් වාතාවරණ එවැනි තැන්වලින් සැලසුණි. සමහර ලෙන්වලට ළඟාවීමට තිබී දුෂ්කරතා ගැන මෙම පොතෙහි පළකර ඇති සී. ඩබ්ලිව්. නිකුලස් මහතාගේ ලිපියෙහි සඳහන් වේ. ලෙන් සෙල් ලිපිවල දැක්වෙන තොරතුරු අනුව සමාජයේ විවිධ තරාතිරම්වල වැසියන් ලෙන් පූජාකර ඇති බව පෙනේ. ලෙන් ලිපිවල සඳහන් තොරතුරු අනුව රජදරුවන්, කුමරුන්ට අමතරව ගම් ප්‍රධානීන්, ගම් මට්ටමේ විවිධ නිලධාරීන් මෙන්ම වනිතාවන් ආදී වශයෙන් සමාජයේ විවිධ තරාතිරම්වල වැසියන් ලෙන් ප්‍රදානය කර ඇත. බ්‍රාහ්මණ වංශිකයන් විසින් ප්‍රදානය කළ ලෙන් ද මේවා අතර වේ. සියුම් උපකරණ නොමැතිව ගල් කටාරම් හෝ සියුම් කවාකාර අක්ෂර, ඝන කළුගල්වල කෙටීම නොකළ හැකි බැවින් එකළ වැසියන් උසස් තත්ත්වයක වානේ හෝ එවැනි උපකරණ භාවිතාකර ඇති බව නිගමනය කළ හැක.

උතුරු මැද පළාතට වර්ෂාව ලැබෙනුයේ සීමිත කාලයකදී බැවින් ඉතිරි කාලයේදී භාවිතා කිරීම සඳහා ජලය රැස්කර තිබීමට පියවර ගැනීමට එකල රජදරුවන්ට සිදු විය. එහි ප්‍රතිඵලය ලෙස මුළු ලොවම මවිත කරවන සුළු විශාල ජලාශ සහ ලොව අභිමානවත් වාරි ශිෂ්ටාචාරයක් බිහිවිය. මහා සාගරය පරදවන විශාල ජලාශ මෙන්ම කුඩා ජලාශ ද දහස් ගණනින් විවිධ පළාත්වල ඉදිවිය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහ උතුරු පළාතේ පමණක් කුඩා වැව් 11,200 ක් 1904 වර්ෂයේදී සිදු කළ ගණන් ගැනීමකදී හඳුනාගෙන ඇත. හඳගල විහාරස්ථානයට අයිති කුඩා වැවද එන් එකකි. එම වැව විහාරස්ථානයේ අවශ්‍යතා සපුරාලීමට අමතරව අවට ගම්වාසීන්ගේ ගෙදරදොරවල අවශ්‍යතා මෙන්ම ගොවිතැන් කටයුතු සඳහා ද පැවති එකම ජල සැපයුම් මාර්ගය වන්නට ඇත.

අනුරාධපුර රාජධානියේ පරිහානිය සහ බිඳවැටීමත් සමගම, ඈත අතීතයේ දී විශාල බැතිමතුන් සංඛ්‍යාවකගේ ආගමික මෙන්ම ආධ්‍යාත්මික ක්ෂේමභූමියක්ව පැවති හඳගල ද පාලුවට ගොස් ඇත. ශතවර්ෂ කිහිපයකට අනතුරුව එහි පැවති ශ්‍රී විභූතිය විදහා දක්වෙන සංකේතවලින් ඉතුරුව තිබෙනුයේ දා ගැබක නටබුන්, පියගැට පෙළක කැබලි ආදිය පමණි.

දැන් ආරම්භ කර තිබෙන දැවැන්ත විස්තීර්ණ සංවර්ධන ව්‍යාපෘතිය නිමවූ විට මෙම ඓතිහාසික පුදබිම නැවතත් සදහම් ආලෝකය පතුරුවන මධ්‍යස්ථානයක් වනවා පමණක් නොව යාබද ගම්බිම් වල සමාජයීය - ආර්ථික සංවර්ධනය සඳහා ශක්තිමක් පදනමක් ද වනු ඇත.